# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.15 පැය 2030 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 69 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**දැරියක් පැහැරගැනීමේ සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර වාතර්ාව - දවුලගල පොලිස් වසම.**

2025.01.11 වන දින දවුලගල පොලිස් වසමේදී වෑන් රථයකින් පැමිණ දැරියක් පැහැරගෙන යාමේ සිද්ධියේ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා දවුලගල පොලිස් ස්ථානය සහ විශේෂ පොලිස් නිලධාරීන් කණ්ඩායම් කිහිපයක් එක්ව විමශර්න ආරම්භ කර තිබුණි.

ඒ අනුව, 2025.01.13 වන දින අම්පාර නගරයේදී, පොලිස් නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙම පැහැරගෙන යාමේ සිද්ධියේ ප්‍රධාන සැකකරු අත්අඩංගුවට ගත් අතර පැහැරගැනීමට ලක් වූ දැරියද නිරුපද්‍රිතව පොලිස් භාරයට ගැනිණි. සිද්ධියට සම්බන්ධ තවත් සැකකරුවෙකු 2025.01.14 වන දින අත්අඩංගුවට ගන්නා ලදී.

මෙම පැහැරගැනීම සඳහා සැකකරුවන් පැමිණි වෑන් රථයද පොලිස් භාරයට ගෙන තිබූ අතර පසුව එහි රියදුරු පොලිස් අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත.

අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාගේ පරීක්ෂාවෙන් පසු දැරිය ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව දෙමාපිය භාරයට පත් කර ඇත. ප්‍රධාන සැකකරු හා පැහැරගැනීමට සම්බන්ධ අනෙක් සැකකරු 2025.01.15 වන අද දින ගම්පොල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2025.01.27 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

දවුලගල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**